**දැනුම මූලික සමාජය සඳහා අධ්‍යාපනය ව්‍යාපෘතිය - 2014**

-------------------------------------------------------------

දැනුම මූලික සමාජය සඳහා අධ්‍යාපනය ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව සමඟ එළඹි 2007 දෙසැම්බර් 18 දිනැති අංක 2371 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ හා අංක 0091- එස්ආර්අයි (එස්එෆ්) දරන ප්‍රදාන ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.02 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---------------------------------------------------------------------------------

ණය ගිවිසුමට හා ප්‍රදාන ගිවිසුමට අනුව දැනුම මූලික සමාජය සඳහා අධ්‍යාපනය ව්‍යාපෘතිය, අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රම වෙළඳපළ අවශ්‍යතාවයන්ට අදාල ද්විතීය හා තෘතීය අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස උගත් තරුණයන්ගේ රැකියාලාභීත්වය වැඩි කිරීම ව්‍යාපෘතියේ අපේක්ෂිත බලපෑම වේ. තත්ත්වය, අදාල බව, ඵලදායක බව වැඩිදියුණු කිරීමේ සහ ද්විතීය හා තෘතීය අධ්‍යාපනයට සමානව ප්‍රවේශවීම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය වේ. ණය හා ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු මිලියන 11,267 කට සමාන එජඩො මිලියන 105 ක් වේ. ඉන් රු මිලියන 6,955 කට සමාන එජඩො මිලියන 65 ක් ණයක් වශයෙන් සහ රු මිලියන 1,605 කට සමාන එජඩො මිලියන 15 ක් ප්‍රදානයක් වශයෙන් ආසියානු සංවර්ධන බැංකුව මූල්‍යනය කිරීමට එකග වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2008 මාර්තු 07 දින ආරම්භ කළ අතර 2013 ජූනි 30 දින අවසන් කිරීමට නියමිත විය. ආසියානු සංවර්ධන බැංකුවේ 2014 අගෝස්තු 07 දිනැති ලිපිය අනුව, ණය සම්පූර්ණ කළ යුතු දිනය 2014 ඔක්තෝබර් 31 දක්වා දීර්ඝ කළ අතර ප්‍රදානය සම්පූර්ණ කළ යුතු දිනය 2014 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලදී.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4. විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි

හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණයදෙන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, අධ්‍යාපන ක්ෂේත්‍රයේ මධ්‍යම ආයතන තුනක් සඳහා මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය සහ ප්‍රදාන යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය සහ ප්‍රදාන යටතේ කරන ලද ආපසු ගැනීම් ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 මතය

---

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඉ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

---

### 3.1 අරමුදල් උපයෝජනය

---

මූල්‍යනය හා සමාලෝචිත වර්ෂය තුළදී අයවැයගත ප්‍රතිපාදනය, අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය සහ ප්‍රදාන ගිවිසුම් වල මූල්‍යනය කිරීමට එකඟ වූ වටිනාකම | | 2014 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු වේ සිදුකළ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | |
|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) |
| ආ.සං.බැ - ණය | 65.00 | 6,955.00 | 1,647.40 | 1,513.24 | 58.54 | 6,264.19 |
| -ප්‍රදාන | 15.00 | 1,605.00 | 370.60 | 331.92 | 15.00 | 1,737.27 |
| ශ්‍රී.ලං.ර | 25.32 | 2,707.00 | 320.00 | 478.43 | 25.32 | 3,587.79 |
| එකතුව | **105.32** | **11,267.00** | **2,338.00** | **2,323.59** | **98.86** | **11,589.25** |

## 3.2 භෞතික කාර්යසාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාසල් 37 ක මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර විවෘත කිරීමේ උත්සව වියදම් සිදු කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් ලබා දුන් රු. මිලියන 10.90 ක අත්තිකාරම් ව්‍යාපෘතියේ කටයුතු සඳහා සෘජු සම්බන්ධයක් නොවීය. එසේම ඒ සඳහා දරන ලද තත්‍ය වියදම තහවුරු කිරීමට උපකාරක ලියකියවිලි කිසිවක් ලබා ගැනීමකින් තොරව එම අත්තිකාරම් පියවා තිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල කාර්ය මණ්ඩල පුහුණු කිරීම් යටතේ එය දක්වා තිබුණි.

(ආ) 2008 සිට "ස්කූල් නෙට්" ජාලය හරහා පාසල් හා අධ්‍යාපන ආයතන 1724 කට අන්තර්ජාල පහසුකම, ව්‍යාපෘතිය විසින් සපයා තිබුණු අතර ඒ සඳහා පරිගණක හා අනෙකුත් උපකරණ සැපයීමට රු. මිලියන 835 ක් වැය කර තිබුණි. ලබා දෙන ලද පද්ධතිවල ඵලදායීතාවය අගය කිරීමට කටයුතු නොකර 2011 සිට 2014 දක්වා එකතුව රු. මිලියන 813.9 ක දුරකථන ගාස්තු ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. පද්ධතියේ වේගය අඩු බව සහ නිරන්තර අඩාල වීම හේතුවෙන් බොහෝ පාසල් අන්තර්ජාලය පරිශීලනය නොකරන බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, "ස්කූල් නෙට්" භාවිතයේ අඩුකම නිසා රු.මිලියන 64 ක පිරිවැයකට ස්ථාපිත කළ අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියද අකර්මන්‍ය බවට පත්වී තිබුණි.

(ඇ) කාර්ය මණ්ඩල පුහුණු කිරීම හා ප්‍රකාශන කටයුතු සඳහා සිදුකළ ප්‍රතිපාදනයන් භාවිතයෙන් මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර ආරම්භ කිරීමේ උත්සව ප්‍රචාරය කිරීමට දරන ලද රු.මිලියන 1.2 ක් වටිනා ප්‍රචාරණ වියදම ව්‍යාපෘති කටයුතුවලට සෘජු සම්බන්ධයක් නොවීය.